**කන්දකැටිය ප්‍රාදේශීය සභාව**
**බදුල්ල දිස්ත්‍රික්කය**
**---------------------------------**

1. **මූල්‍ය ප්‍රකාශන**
----------------

1.1 **මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම**
---------------------------------

2017 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2018 මාර්තු 29 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර,එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2018 අගෝස්තු 30 වන දින සභාපතිවරයාට යවා ඇත.

1.2 **තත්ත්වාගණනය කළ මතය**
--------------------------------

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශන වලින් 2017 දෙසැම්බර් 31 දිනට කන්දකැටිය ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම වලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.3 **මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**
-----------------------------------------

1.3.1 **ගිණුම්කරණ අඩුපාඩු**
------------------------

පහත දැක්වෙන ගිණුම්කරණ අඩුපාඩු විගණනයේ දී නිරීක්ෂණය විය.

(අ) සමාලෝචිත වර්ෂයේ ජුනි 30 දින කන්දකැටිය මහජන බැංකුවේ තැන්පත් කර තිබූ රු.1,500,000 ක ස්ථාවර තැන්පත්වලට අදාළ ලැබිය යුතු පොළිය වූ රු.86,250 ක් ගිණුම් වලට නොගැනීම හේතුවෙන් එම වටිනාකමින් ආදායම් අඩුවෙන් දක්වා තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂය තුළ පුස්තකාල පොත් මිළට ගැනීමේදී රු.104,006 ක ලද වට්ටම් සඳහා ලැබුණු පොත් වල වටිනාකම ගිණුම් ගත නොකිරීම හේතුවෙන් ස්ථාවර වත්කම් සහ ප්‍රාග්ධන යෙදවුමට ආදායමින් දායකවීම් ගිණුම් එම වටිනාකමින් අඩුවෙන් දක්වා තිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂය තුළදී ශ්‍රවණාගාරයට ශබ්ද විකාශන යන්ත්‍රය මිළදීගැනීම වෙනුවෙන් ගෙවිය යුතු රු.79,400 ක් සඳහා ණය හිමි ප්‍රතිපාදන සලසා නොතිබුණි.

(ඈ) 2015 වර්ෂයට අදාළව සමාලෝචිත වර්ෂයේදී ලැබුණු රු.361,240 ක උසාවි දඩ ගාස්තු ප්‍රවර්තන වර්ෂයේ ආදායමක් ලෙස ගිණුම්ගත කිරීම නිසා එම වටිනාකමින් අතිරික්තය වැඩියෙන් දක්වා තිබුණි.

(ඉ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට හිඟ හිටි මුද්දර ගාස්තු රු.589,781 ක් වුවද, එය රු.387,130 ක් ලෙස ගිණුම්ගත කිරීම නිසා ජංගම වත්කම් රු.202,650 ක් අඩුවෙන් දක්වා තිබුණි.

(ඊ) ඉදිරි වර්ෂය වෙනුවෙන් ලැබුණු පාරිසරික ආරක්ෂණ බලපත්‍ර ගාස්තු රු.63,874 ක් සමාලෝචිත වර්ෂයේ ආදායම් වශයෙන් ගිණුම්ගත කිරීම හේතුවෙන් එම වටිනාකමින් අතිරික්තය වැඩියෙන් දක්වා තිබුණි.

1.3.2 **නොසැසඳු ගිණුම්**

--------------------

පසුගිය වර්ෂයේ මුලා ප්‍රකාශනයේ සමුච්චිත අරමුදල හා ප්‍රාග්ධන යෙදවුමට ආදායමෙන් දායකවීම් ගිණුම්වල ශේෂයන් සමාලෝචිත වර්ෂයේ ආරම්භක ශේෂ ලෙස ගෙන ඒමේදී රු.6,794,367 ක වෙනසක් නිරූපනය වී තිබුණි.

1.3.3 **ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්**

-----------------------------------

(අ) **ලැබිය යුතු ගිණුම්**

---------------------

සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට අයකර ගත යුතු රු. 7,208,488 ක් වු ලැබිය යුතු ගිණුම් ශේෂය තුළ ව්‍යාපෘති වෙනුවෙන් අදාල ආයතන වලින් වර්ෂයක සිට අය කර ගත යුතු රු.6,833,945 ක්,වෙනත් ආදායම් රු.10,350 ක්, වර්ෂ 3 ක කාලයක සිට පැවත එන හිඟ හිටි ජල ගාස්තු රු.296,694 ක්, හා වර්ෂයක් තුළ අයවිය යුතු අත්තිකාරම් රු.67,499 ක් සමාලෝචිත වර්ෂයේදී අය කරගෙන නොතිබුණි.

(ආ) **ගෙවිය යුතු ගිණුම්**

---------------------

සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට රු.10,732,346 ක් වු ගෙවිය යුතු ගිණුම් ශේෂය තුළ වර්ෂයක කාලයක සිට පැවත එන විවිධ වියදම් ණයහිමියෝ රු.3,644,384 ක්, කර්මාන්ත ණයහිමි රු.5,971,406 ක් හා වර්ෂ 7 ක කාලයක සිට පැවත එන රු.1,116,556 ක් සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් ගෙවා නොතිබුණි.

1.3.4 **විගණනය සඳහා සාක්ෂි නොවීම**

-------------------------------------

අවශ්‍ය තොරතුරු විගණනයට ඉදිරිපත් නොකිරීම නිසා එකතුව රු.16,636,205 ක් වු ඉඩම් ගොඩනැඟිලි හා ණයහිමියෝ විගණනයේදී සතුටුදායක ලෙස සත්නිරීක්ෂණය හා සත්‍යාක්ෂණය කිරීමට නොහැකි විය.

1.3.5 **අනුකූල නොවීම්**

-------------------

1.3.5.1 **නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්**

---------------------------------------------------------------------------

නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| | **නීති,රීති,රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව** | **වටිනාකම** | **අනුකූල නොවීම** |
|---|---|---|---|
| | ------------------------------- | -------------- | ---------------------- |
| | | රු. | |
| (අ) | 1987 අංක 15 දරන ප්‍රාදේශිය සභා පනත<br>වගන්ති 158, 159 | 298,599 | ඉකුත් වර්ෂයේ හිඟ ආදායම් හා සමාලෝචිත වර්ෂයේ හිඟ ආදායම් අයකරගෙන නොතිබුණි. |

| | | | |
|---|---|---|---|
| (ආ) | 1980 අංක 47 සහ 1988 අංක 56 දරන ජාතික පාරිසරික පනතේ 2000 අංක 53 දරන පනත් වලින් සංශෝධිත 2008 ජනවාරි 25 දිනැති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 1533/16 ගැසට් නිවේදනය | 120,000 | සමාලෝචිත වර්ෂයට අදාළව ව්‍යාපාර 305 න් අයවිය යුතු පාරිසරික බලපත්‍ර ආදායම් අයකරගෙන නොතිබුණි. |
| (ඇ) | 1988 ප්‍රාදේශිය සභා (මූල්‍ය හා පරිපාලන) රීති 218 | | සභාව සතු ඉඩම් හා ගොඩනැගිලි වාර්ෂිකව සමීක්ෂණය කර වාර්තාවක් ලබාගෙන නොතිබුණි. |
| (ඈ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ xxiv පරිච්ඡේදයේ 1.6 වගන්තිය | 5,249 | සභාවේ සේවය කර ස්ථාන මාරුවීම් ලැබූ සේවකයින් තිදෙනෙකුගෙන් අය විය යුතු ණය ශේෂයක් අය කරගෙන නොතිබුණු අතර, එය වසර 14 සිට වසර 20 දක්වා පැරණි ශේෂයන් විය. |

02. **මූල්‍ය සමාලෝචනය**

-----------------------

2.1 **මූල්‍ය ප්‍රතිඵල**

--------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු3,542,705 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු3,715,471 ක් විය.

2.2 **ආදායම් පරිපාලනය**

----------------------

2.2.1 **ඇස්තමේන්තුගත ආදායම්,බිල්කළ ආදායම්,රැස්කළ ආදායම් හා හිඟ ආදායම්**

-------------------------------------------------------------------------------------

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාළව ඉදිරිපත් කර තිබුණු ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | | 2017 | | | | 2016 | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තු ගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තුගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| (i) | කුලී | 2,459,112 | 2,459,112 | 2,061,632 | 397,480 | 2,074,645 | 2,074,645 | 1,465,267 | 609,378 |
| (ii) | බලපත්‍ර ගාස්තු | 648,000 | 648,000 | 648,000 | -- | 540,000 | 540,000 | 540,000 | -- |
| (iii) | වෙනත් ආදායම | 47,001,220 | 47,001,220 | 38,214,598 | 8,786,622 | 38,049,180 | 38,049,180 | 30,557,140 | 7,492,040 |
| | එකතුව | 50,108,332 | 50,108,332 | 40,924,230 | 9,184,102 | 40,663,825 | 40,663,825 | 35,562,407 | 8,101,418 |

### 2.2.2 ආදායම් රැස්කිරීමේ කාර්ය සාධනය

2017 දෙසැම්බර් 31 දිනට මුළු බිල්කල ආදායම රුපියල් මිලියන 50 ක් වූ අතර, වර්ෂය තුල රැස්කල ආදායම් රුපියල් මිලියන 40 ක් විය. කෙසේ වුවත් වර්ෂය අවසාන වන විට රුපියල් මිලියන 9.1 ක ආදායමක් රැස්කර ගැනීමට තිබුණු අතර, පෙර වර්ෂය සමඟ සැසඳීමේදී හිඟ ආදායම් අයකර ගැනීම සියයට 13 කින් අඩු වී තිබුණි.

### 2.2.3 උසාවි දඩ හා මුද්දර ගාස්තු

පළාත් සභාවේ ප්‍රධාන ලේකම් වරයාගෙන් හා අනෙකුත් ආයතන වලින් 2017 දෙසැම්බර් 31 දිනට උසාවි දඩ වෙනුවෙන් රු.1,659,943 ක් සහ මුද්දර ගාස්තු වෙනුවෙන් රු.387,130 ක් අයවිය යුතුව තිබුණි.

## 03. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කාර්ය සාධනය

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගිතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම,ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුභ සාධනය යන සභාව විසින් ඉටු කළ යුතුව තිබුණු කර්තව්‍යයන් ඉටු කිරීම පිළිබඳව අනාවරණය වූ කරුණු පහත දැක්වේ.

#### (අ) අතුරු ව්‍යවස්ථා

1987 ප්‍රාදේශීය සභා පනතේ 126 වගන්තිය අනුව ප්‍රධාන කාරණා 30 ක් ඉටු කිරීම සඳහා අතුරු ව්‍යවස්ථා පැනවිය යුතු වුවත්, 2017 දෙසැම්බර් 31 දිනට කාරණා 10 ක් සඳහා අතුරු ව්‍යවස්ථා පනවා නොතිබුණි.

(ආ) **ක්‍රියාකාරි සැලැස්ම**

---------------------

පනවා තිබූ අතුරු ව්‍යවස්ථා අනුව සභාව ඉටුකළ යුතුව තිබුණු කර්තව්‍යයන් වෙනුවෙන් වාර්ෂික ක්‍රියාකාරි සැලැස්මක් සකස් කර නොතිබුණි.

(ඇ) **ඝන අපද්‍රව්‍ය කළමනාකරණය**

---------------------------------

1980 අංක 47 දරන පාරිසරික පනතට හා 1988 අංක 56 (සංශෝධිත) හා 2000 අංක 53 සංශෝධිත හා 2008 පෙබරවාරි 02 දිනැති ගැසට් අංක 1534/18 අනුව කසළ වර්ග කර ප්‍රතිචක්‍රීකරණය කළ යුතු වුවත්,එසේ කර නොතිබුණි.

(ඇ) **තිරසාර සංවර්ධන ඉලක්ක**

-------------------------------

තිරසර සංවර්ධන අරමුණු සම්බන්ධයෙන් වූ 2030 න්‍යාය පත්‍රය පිළිබඳව සභාව දැනුවත්ව නොසිටීම හේතුවෙන් එම අරමුණු සඳහා වන ගෝලීය දර්ශක තුළින් සභා බල ප්‍රදේශයේ මහජනතාවගේ ජීවන තත්ත්වය සහ සෞඛ්‍ය නංවාලීම සඳහා වන දිගු කාලීන සැලසුම් 2018 මැයි 14 දින වන විටත් සකස් කර නොතිබුණි.

3.2 **කළමනාකරණ අකාර්යක්ෂමතා**

------------------------------------

2015 ජුලි 27 දින පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය මඟින් පරිත්‍යාග කර තිබූ රු.24,928,666 ක් වටිනා මෝටර් ග්‍රේඩරය ක්‍රියාත්මක කිරීමට රියදුරෙකු නොමැතිවීම නිසා 2018 පෙබරවාරි 20 දිනය දක්වාම නිශ්ක්‍රීයව පැවතුනි.

3.3 **මානව සම්පත් කළමනාකරණය**

------------------------------------

ප්‍රාදේශිය සභාවේ අනුමත කාර්ය මණ්ඩලය 41 ක් වූ අතර, 2017 දෙසැම්බර් 31 දිනට තථ්‍ය කාර්ය මණ්ඩලය 34 කි. තනතුරු 07 ක් දීර්ඝ කාලයක සිට පුරප්පාඩු වී තිබුණි.

3.4 **මෙහෙයුම් අකාර්යක්ෂමතා**

-------------------------------

සභාව සතු සුසාන භූමි වලට අයත් ඉඩම් සහ ගොඩනැඟිලි මැන පවරාගත යුතු වුවත්, අක්කර 40 ක පමණ වන සුසාන භූමි මැන නිරවුල් කරගෙන නොතිබුණි.

3.5 **වත්කම් කළමණාකරණය**

----------------------------

3.5.1 **නිශ්ක්‍රීය වත්කම්**

------------------

ආයතනය සතු අබලන් වූ හා භාවිතා කිරීමට නොහැකි වාහන අපහරණය කිරීමට කටයුතු කලයුතු වුවත්, පොත් අගය රු.1,620,000 ක් වන වසර 5කට ආසන්න කාලයක් නිශ්ක්‍රියව පවතින ඩබල් කැබ් රථයක්, අත් ට්‍රැක්ටරයක් අපහරණය කිරීමට කටයුතු කර නොතිබුණි.

3.6 **ප්‍රසම්පාදනය**

--------------

3.6.1. **ප්‍රසම්පාදන සැලැස්ම**

-------------------------

සමාලෝචිත වර්ෂය සඳහා ප්‍රාදේශිය සභාව විසින් වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්මක් සකස් කර නොතිබුණි.

04. **ගිණුම් කටයුතු භාවය හා යහපාලනය**

----------------------------------------

4.1 **අයවැය පාලනය**

-------------------

සමාලෝචිත වර්ෂයට අදාළව ප්‍රාදේශිය සභාවේ අයවැයගත ආදායම් හා වියදම්, තථ්‍ය ආදායම් හා වියදම් සමඟ සැසඳීමේදි සැලකිය යුතු විචලනයක් නිරීක්ෂණය වු බැවින්, අයවැය ලේඛනය ඵලදායි පාලන කාරකයක් ලෙස යොදාගෙන නොතිබුණි. විස්තර පහත දැක්වේ.

(අ) සත්‍ය ආදායම් අයවැයගත ආදායම් සමඟ සැසඳීමේදී විෂයයන් 06 ක විචලනය සියයට 3 සිට 108 දක්වා වු පරාසයක් ගෙන තිබුණි.

(ආ) වියදම් විෂයයන් 07 ක සත්‍ය වියදම අයවැයගත වියදම සමඟ සැසඳීමේදී විචලනය සියයට 4 සිට සියයට 93 දක්වා වු පරාසයක් ගෙන තිබුණි.

5. **පද්ධති හා පාලන**

-------------------

විගණනයේදී නිරීක්ෂණය වු අඩුපාඩු වරින්වර සභාවේ අවධානයට යොමුකර ඇති අතර, පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතුය.

| | **පද්ධතිය** | | **අඩුපාඩුව** |
|---|---|---|---|
| (අ) | ගිණුම්කරණය | (i) | පොදු තැන්පත් කාල විශ්ලේෂණ සකස් කර නොතිබීම. |
| | | (ii) | ස්ථාවර තැන්පත් නිවැරදිව ගිණුම්ගත නොකිරීම. |
| | | (iii) | ලැබිය යුතු ආදායම් ගණනය නොකිරිම. |
| (අ) | ආදායම් පරිපාලන | (i) | වර්ෂයට අදාළ ඇතැම් ආදායම් ප්‍රභවයන් නිවැරදිව හඳුනාගෙන නොතිබීම. |
| | | (ii) | ආදායම් ලේඛන සම්පූර්ණ කර නොතිබීම. |
| (ඇ) | ව්‍යාපෘති/කොන්ත්‍රාත් | | අත්තිකාරම් මුදල් අය කර නොගැනීම. |